**තෑග හා දිරිදීමනා අරමුදල - 2017**

-----------------------------------------

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 8 දරන මෝටර් රථ ප්‍රවාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද මෝටර් රථ ප්‍රවාහන පනතේ (203 අධිකාරය) 213 ඈ (5) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා දිරි දීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට අදාලව නිලධාරීන් විසින් හිමිකම් නොපෑ රු.512,665 ක් වූ දිරිදීමනා හා එම මුදලින් නැවත ගෙවා තිබුණු රු.481,707 ක් බැරකම් ගිණුමක් මාර්ගයෙන් ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් හා වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.30,958 කින් වැඩියෙන් හා වගකීම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයට අදාලව විවිධ කරුණු හේතුවෙන් නොගෙවූ එකතුව රු.719,265 ක් වූ දිරිදීමනා එම වර්ෂයේ ගෙවිය යුතු වියදමක් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා, විනෝද කටයුතු, සුභසාධන කටයුතු වෙනුවෙන් අරමුදල විසින් 2016 වර්ෂයේ දී ගෙවා තිබූ මුදලින් ආපසු ලැබී තිබූ රු.50,000 ක මුදල සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2(ආ) ඡේදය අනුව අරමුදලේ කටයුතු වෙනුවෙන් ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්තයක් වේ නම්, එය අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කල යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පැවති රු.2,686,700 ක අතිරික්තය එසේ ඒකාබද්ධ අරමුදලට මාරු කර නොතිබුණි. එසේම අරමුදලේ ගිණුම් සසඳා ප්‍රගතිය පිළිබඳ එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා ද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2011 අංක 04 දරන මෝටර් වාහන පනතේ (ත්‍යාග හා දිරිදීමනා අරමුදල) නියෝග 3 (ඇ) ඡේදය පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණු හා අධ්‍යාපන කටයුතු සඳහා ගෙවිය යුතු උපරිම මුදල වසරකට රු.100,000 ක් ලෙස දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා රු.364,640 ක් වැය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,686,700 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,692,728 වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,028 ක පිරිහීමක් ඇති වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

මෝටර් රථ වාහන පනතේ 23 (ඇ) වගන්තියේ නියෝග අංක 3 ප්‍රකාරව පනතේ දක්වා තිබූ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමකින් තොරව අරමුදලේ ලැබීම් වලින් සියයට 92 කට වැඩි ප්‍රමාණයක් දිරිදීමනා ගෙවීම් සඳහා පමණක් වැය කර තිබුණි.

(අ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව යම් මෝටර් රථයක් සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, අළුතින් නිර්මාණය කිරීමේ, අනුවර්තනය කිරීමේ, විකරණය කිරීමේ හා නිර්මාණය වෙනස් කිරීමේ නියුක්තව සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු සපයන පාර්ශවයන් වෙත ත්‍යාග මුදල් ගෙවීම.

(ආ) ඇතැම් සාවද්‍ය ක්‍රියා හඳුනාගැනීම සඳහා තොරතුරු සපයනු ලබන හෝ එවැනි සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගැනීමේ යෙදී සිටින තැනැත්තන්ට ත්‍යාග මුදල් ගෙවීම.

(ඇ) ප්‍රශංසාත්මක හෝ විශේෂ ඇගයීමක් අවශ්‍ය වන්නා වූ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා වර්ෂයකට රු. 50,000 ක් නොඉක්මවන පරිදි ත්‍යාග මුදල් ගෙවීම.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන දිරි දීමනා යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් අනුමත කරගෙන තිබූ දිරිදීමනා යෝජනා ක්‍රමවේදයට පටහැනිව දෙපාර්තමේන්තුවේ අංශ 06 ක දිරිදීමනා ගණනය කර තිබූ අතර එම යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන කාර්යසාධක දර්ශක 03 ක් යටතේ ලකුණු ලබාදිය යුතු වුවද දෙපාර්තමේන්තුවේ අංශ 11 ක දිරිදීමනා ගණනය කිරීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ආ) දිරිදීමනා අරමුදලේ මෙහෙයුම් කටයුතු සඳහා සංවර්ධන අංශයේ අතිරේක හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු යටතේ තිදෙනකුගෙන් යුත් කමිටුවක් පත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) යෝජනා ක්‍රමයේ 8.7 ඡේදය ප්‍රකාරව දිරිදීමනා යෝජනා ක්‍රමය සෑම වර්ෂ 3 කට වරක් සමාලෝචනයට ලක් විය යුතු බව අවධාරණය කර තිබුණද 2010 වර්ෂයේ ආරම්භ කර තිබූ මෙම යෝජනා ක්‍රමය මෙම වාර්තාවේ දින වන විටත් සමාලෝචනයකට ලක් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) දිරිදීමනා ගෙවීම් සඳහා යෝජනා ක්‍රමයේ 5.8 වගන්තියට පටහැනි ලෙස එක් එක් කාර්තුව අවසානයේ අවසන් නොවූ වැඩ පැවති අංශ 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ iv වන කාර්තුව සඳහා දිරිදීමනා ගෙවා තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල විසින් 2017 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | දිරිදීමනා නිවැරදිව ගණනය කර ගිණුම් තැබීමට කටයුතු නොකිරීම. |
| (ආ) මූල්‍ය පාලනය | බැංකු ගිණුම් සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වා නොතිබීම. |